# සූර ගොවියෙක්

මතුගම මාස්ලියැද්දේ ඉද්දගොඩ නිවැසි අවුරුදු 26 ක්, වයසැති ඩී. ඩී. ධර්මසේන නමැති අය ඉතා දක්ෂ අප්‍රතිහත ධෛර්ය යෙන් යුක්ත සූර ගොවියෙකි. ඔහු විවාහක යෙකි. සිංහල, ඉංග්‍රීසි අට වන ප්‍රමාණය තෙක් පමණක් උගත් මොහු 1959 දී, පමණ නිසි රැකියාවක් සොයමින් තැනින් තැන ගොස් කොළඹ වෙළඳ ආයතනයක මසකට රු. 150 ක්, ලබාගත හැකි රැකියාවක් ලබා ගත්තේය. ගම්බද ගොවි ජීවිතයට හුරු පුරුදු වී සිටිය ඔහුට රක්ෂාවල් තිත්ත විය. නාගරික ජීවිතය පුහු ආටෝපයෙන් පිරි කෝලම් මඩුවක් විය. එහෙයින් ඔහු රැකියාව අතහැර ගම් පියසට සමීප වූයේ දැඩි අධිෂ්ඨානයක් ඇති වය. "මම නිවහල් නිහතමානි ගොවියෙක් වන්නෙමි." යන පිවිතුරු හඬ ඔහුගේ ධෛර්යමත් ගොවි සිත තුළ රැව් පිළිරැව් දෙන්නට විය.

ඔහු විශාල ඉඩම් හිමියෙක් නොවේ. ඔහුට ඇත්තේ ගොඩ ඉඩම් අක්කර තුන හමාරක් හා මඩ ඉඩම් අක්කර තුනක් හා නිවාසයක් පමණකි. ඉන්පසු පළමුවරට කුඹුරු ගොවි



සූර ගොවියාගේ සාරවත් කුඹුර

තැන් වැඩ ආරම්භ කළ ඔහු ක්‍රමානුකූල නව ගොවිතැන් ක්‍රම නොදත් බැවින් ඔහුට ලබා ගත හැකි වූයේ ඉතා අල්ප අස්වැන්නකි.

එයින් පසුබට නොවූ අපේ ශූර ගොවියාට 1965 මුල් භාගයේදී පමණ මතුගම කෘෂිකර්ම උපදේශක මහතාගෙන් නවීන ගොවිතැන් ක්‍රම පිළිබඳව වටිනා උපදෙස් රැසක් ලබා ගැනීමට හැකි විය.



එළවළු කොටුව

පළමුවෙන්ම ඔහු ඔහුගේ ඉඩමේ ජල සංරක්ෂණ ක්‍රම ක්‍රියාවේ යොදන්නට විය. ඔහු කඳු මුදුනකින් ගිය සීතල දිය දහරක් තමන්ගේ ඉඩමට හරවාගෙන එයින් තමන්ගේ ඉඩම ජල තටාකවලින් පිරි සරුසාර භූමි භාගයක් බවට පරිවර්තනය කර ගත්තේය. 1965 පළමු වරට තමන්ගේ කුඹුරේ පේලියට වී ඇට දමා ක්‍රමානුකූල ලෙස නියම අවධිවලදී රසායනික පොහොර ආදියද යෙදූ බැවින් ඔහුගේ අස්වැන්න දෙගුණ තෙගුණ විය. ඔහුගේ එළවළු කොටුවට ද රසායනික පොහොර පළමු වරට යෙදූ ඔහු කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් උසස් වර්ගයේ එළවළු ඇට ද ගෙන්වාගෙන වගාව ජයටම අරඹා සරුසාර එළවළු කොටුවක් මගින් මුළු මහත් පෙදෙසටම අගනා

ආදශීයක් දුන්නේය. ඔහුට දැන් ඇති අඩු පාඩුව සතුන් ඇති කිරීම පිළිබඳ දැනීමක් බව තේරුම් ගත් ධර්මසේන 1965 අගෝස්තු හරියේදී පලාතේ කෘෂිකර්ම උපදේශක මහතාගේ අනුදැනීම ඇතිව වැලිසර ගොවි පලේ ඌරන් ඇති කිරීම පිළිබඳව



ඌරු පට්ටිය

තවත් පුළුල් කර ගත්තේය. ඉන්පසු තාරාවුන් ඇති කිරීම තමන්ට හුරු පුරුදු කාර්යයක් නොවූවද, " මස්කොවි " හා " කාකි කැම්බල් " යන තාරාවුන් වර්ගයන්ගෙන් පැටවූ තිහක් පමණ මිලයට ගෙන



කුකුළු පට්ටිය

පසුව තම ගෙවත්තේ මීමැසි පෙට්ටි දෙකක්ද, සවි කරගත් ඔහු කෙසෙල් පඳුරු 110 ක් හා කෝපි පඳුරු 30 ක් ද අන්නාසි පැළ 100 ක්, සිටවා ගත්



තාරාවුන් ඇති කරන පොකුණ

දින දෙකක පුහුණුවක්ද කරඳගොල්ලේ කුකුළු ගොවිපලේ සති තුනක පුහුණුවක්ද ලබා ගත්තේය. ඉන් පසුව තව තවත් ආත්ම විශ්වාසයෙන් යුතුවූ අපේ මේ තරුණ ගොවියා ඌරන් අට දෙනෙකුගෙන් යුක්ත කුඩා ඌරු කොටුවක්ද, කිකිළියන් 50 ක්, පමණ ඇතිකළ හැකි ඝන ආස්තරණ කුකුළු ගෙයක්ද ආරම්භ කොට, නොබෝ කලකින් කිරි හරක් හතර දෙනෙක් මිලයට ගෙන තමන්ගේ ගොවි වැඩ මහත් උනන්දුවෙන් හා ධෛර්යවත් පිළිවෙළට ආරම්භ කළේය. ඉන් සෑහීමකට පත් නොවූ අපේ මේ තරුණයා මාලුන් ඇති කිරීම සඳහා විශාල පොකුණක්ද සාදා ධීවර දෙපාතීමේන් තුවෙන් " ගුරාමීස් " හා " තෙලපියාස් " නමැති මාලු පැටවුන් 50 ක්, පමණ නොමිළයේ ලබාගෙන තමන්ගේ ගොවි කටයුතු තව

තේය. තවත්, සෑහීමකට පත් නොවූ ඔහුගේ ගොවිසිත තව තවත් කෘෂිකාර්මික අරමුණු කරා ඔහු මෙහෙය වන්නට විය. ඔහු කෘෂි කර්ම උපදේශක මහතා මගින් පැළ තවා



සූර ගොවියාගේ, කිරි එළදෙනුන් හා එළුවන්

නක් ඉදි කිරීම සඳහා ලියා පදිංචි වීමට කෘෂි කර්ම දෙපාර්තමේන්තුවට අයදුම් පතක්ද මේ නොබෝදා ඉදිරිපත් කළේය.

ඔහුගේ ගොවිපළට වසරක්වත් තවම පිරී නොතිබුණද, ඔහු දිනකට කිරි බෝතල් 9ක්ද කිකිළි බිත්තර 10 ක්ද, ලබා ගනී. ඔහුගේ කෙසෙල් පඳුරු 110 න් මසකට රු. 25 ක්, පමණ අමතර ආදායමක් ලැබෙන අතර කෝපි පඳුරු 30 න් හා අන්නාසි පඳුරු 100 න් ද, සෑහෙන අමතර ආදායම් ලැබේ. ඔහුගේ ගෙවත්තේ ඇති මී මැසි පෙට්ටි දෙකෙන් ඔහු වසරකට මී පැනි බෝතල දෙක තුනක් ලබා ගන්නා අතර කවරදාවත් ගෙදර දොර පාවිච්චිය සඳහා එළවළු මිළයට නොගන්නවා පමණක් නොව එළවළු වෙළඳාමෙන්ද, මසකට රු. 25 ක, පමණ ආදායමක් ලබා ගනියි. මේ හැර ඔහුට ස්ථිර ආදායම් ලබා දෙන රබර් අක්කර යක පමණ භූමි භාගයක් ද ඇත.

ඔහු මෙසේ ගොවිතැන් කරන්නේ තමන්ගේ හුදු විනෝදය හා ජීවනෝපාය සඳහාය. තවද, මෙවර බටහිර පස් යොදුන් කෝරළයේ පවත්වන්නට යෙදුන ගොවි කාරක සභා තරඟයේ මුල් තැන මොහු දිනා ගැනීමෙන් පසු පළාතේ ගොවි රජා වශයෙන්ද තේරී ඇත.

අප කාටත් මොහුගේ ගොවිතැන් ක්‍රමයෙන් විශේෂයෙන්ම උපදෙසක් වශයෙන් ගත හැක්කේ මොහුගේ මිශ්‍ර ගොවිතැන් ක්‍රමයයි. පැළ වර්ග මෙන්ම සතුන්ද එකම ඉඩමේ මාරුවෙන් මාරුවට වගා කිරීම මිශ්‍ර ගොවිතැන වශයෙන් හඳුනවා දිය හැක. මෙම ක්‍රමයෙන් පසේ සාරවත් බව මනාලෙස රැකෙයි. දියුණු රටවල හොඳ ආදර්ශමත් ගොවියෙකු තෝරා ගන්නේ ඔහු ලබාගන්නා අස්වැන්නෙන් පමණක් නොවේ. හොඳ ගොවියෙක් නම් ශත වර්ෂයක කාලයක් වුවද, තමන්ගේ



මිශ්‍ර පොහොර

ගොවිපළෙන් හොඳ අස්වැන්නක් ලබා ගන්නා අතරම තමන්ගේ ගොවිපළ තුළ පසේ සාරවත් බවද ඒ මුළු මහත් ශත වර්ෂය තුළම සාරවත් ලෙස තබා ගත යුතුය.